ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

# පුරප්පාඩු

# ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## (01) අධ්‍යක්ෂ (බලාත්මක කිරීම හා ක්‍රියාත්මක කිරීම) (පුරප්පාඩු 01)

**i. රැකියා විස්තරය**

ආයතනය පිහිටුවීමට අදාළ වන පනත ඇතුළු අදාළ වන අනෙකුත් සියලු නීති රෙගුලාසි අර්ථ කථනය කිරීම හා ක්‍රියාත්මක කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් කටයුතු කරන ජාත්‍යන්තර ආයතන සමග එක්ව කටයුතු කිරීම, එම ආයතන හා එක්ව කාලානුරූපීව නීති රෙගුලාසි හා තොරතුරු යාවත්කාලීන කිරීම හා එම නියමයන් ශ්‍රී ලංකාව තුළ අනුගමනය කිරීම, තහනම් ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාළ වන අප රටෙහි රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීම, ආයතනය පිහිටුවීමට අදාළ වූ පනත මගින් පවරනු ලබන කාර්යයන් හා අධ්‍යක්ෂ ජනරාල් විසින් පවරා දෙනු ලබන ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්යයන් ක්‍රියාවේ යෙදවීම.

**ii. සුදුසකම් :**

(අ) බාහිර අයදුම්කරුවන්

නීතිය / අපරාධ විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සමග

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම සහ රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර මට්ටමේ" තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් : (පහත සඳහන් 1 හෝ 2)

01. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහාවන සුදුසුකම් සපුරා තිබීම.

02. කළමනාකාර සේවා (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**iii. වැටුප් පරිමාණය**

HM 1-1 - රු. 80,295 – 15x2,270 – 114,345

**iv. වයස :**

අවු. 35 ට නොඅඩු හා අවු. 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

## 02. මාණ්ඩලීය ලේකම් / නීති නිලධාරී (පුරප්පාඩු 01)

**i. රැකියා විස්තරය**

ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනයේ 2013 අංක 33 දරන පනතට අනුව නීති රීති රෙගුලාසි සම්බන්ධයෙන් ලියවිලි සකස් කිරීම, ලෝක උත්තේජක මර්දන නියෝජ්‍යායතනය විසින් නිකුත් කරනු ලබන නීති රීති රෙගුලාසි අනුව කටයුතු කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ලේකම් ලෙස කටයුතු කිරීම, තහනම් උත්තේජක භාවිතයේ දී මතුවන නීතිමය කටයුතුවලට මැදිහත් වීම හා ආයතනය වග උත්තරකරු වූ නඩු සම්බන්ධයෙන් නීති උපදෙස් ලබාදීම හා පෙනී සිටීම.

**ii. සුදුසුකම් හා පළපුරුද්ද :**

(අ) බාහිර අයදුම්කරුවන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් සහිත ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වීම.

සහ

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයෙකු ලෙස එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

සහ

(ඇ) ඉංග්‍රීසි භාෂාවෙන් මනා ලෙස වැඩ කිරීමේ හැකියාවක් තිබිය යුතුයි.

**iii. වැටුප් පරිමාණය**

MM 1-1 - 2016 (රු. 53,175/- - 10xරු. 1,375/- - 15xරු. 1,910/- - රු. 95,575/-)
(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 02/2016 අනුව)

**iv. වයස**

අවුරුදු 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුයි.

**v. බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

## පොදු කොන්දේසි :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.

ii. තනතුරට පැවරෙණ කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුයි.

- ❖ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් 8% ක් හා ආයතනය විසින් 12% ක් අර්ථ සාධක අර මුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත)
- ❖ අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද අනුව කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්පත්, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.
- ❖ අයදුම්පත් ඉදිරිපත් කිරීමේ ක්‍රමය අයදුම්කරුවන් විසින් සහතිකපත්, චරිත සහතිකවල පිටපත්, ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග තම ජීව දත්ත තොරතුරු 2021.11.05 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය, 363/12, සුගතදාස ස්ටේඩියම් – බ්ලොක් ඩී, ක්‍රීඩා සංකීර්ණ රථගාල පාර, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- ❖ එසේ නොවන සහ අයදුම්පත් භාරගන්නා දිනට පසුව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- ❖ රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ❖ අයදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.
- ❖ මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා උත්තේජක මර්දන නියෝජ්‍යායතනය.**

**දුරකථන : 0113071838**